


**කරුණාරත්න සේනානායක විසිනි.**

සුරත කබාය මත තැබූ හේ යට සාක්කුවේ වූ මුදල් පසුම්බිය සුරැකිව තිබේදැයි විපරම් කර බැලීය. දහසක් සිතිවිලි ඔහුගේ සිහියට නැගෙයි. වේදනාව මුසු දැඩි සතුටක් ඒ සියල්ල මැඩගෙන ඉස්මතු වෙයි.

ගුරු පාර පාලුය. පේන තෙක් මානයේ කෙලින් විහිදී එහි ඇසට පෙනෙන හරියක කිසිවෙකු නැත. හේ කබා සාක්කුවෙන් ගත් ලේන්සුවකින් නලලෙහි මතු වූ ඩාබිඳු පිස දැමී ය. කපොල් තලය ඔස්සේ රූරා වැටුනු ඩාබිඳුවක් ඔහුගේ යටිතොල මත පතිත විය. එහි ලවන රසය ඔහුට දැනිනි. ලේන්සුව තවමත් ඔහුගේ අතේ ය. එහෙත් තොල මත වැටුනු ඩාබිඳුව පිස දැමීමට හේ උනන්දු නොවීය. ගත වූ සත් මස තුළ තම සිරුරෙන් දස දහස් ගණන් ඩා බිඳු වැගිරෙන්නට ඇත. කුඹුරෙහි පස මත පතිත වූ ඩා බිඳු ගොයම් ගස් කීපයකට හෝ අවශ්‍ය ජලය සපයන්නට ඇත.

"ඩාදියෙන් ගොයමට ජලය......? නෑ නෑ වෙන්නට බෑ...... ඩාදිය යනු සිරුරෙන් පිට කෙරෙන ලවන......ලුනු ගොයමට අගුනයි. ලුනු දිය ගොයමට අහිත කරයි. එසේ නම් මෙතරම් අස්වැන්නක් ?" හේ කල්පනා කෙළේ ය. "ඩාදියෙන් ගොයමට සැපයෙන්නට ඇත්තේ ඇමෝනියා"

අවසානයේ හේ අනුමාන කෙළේ ය.

ජීවිතයේ මෙතරම් සතුටක් විඳි දිනයක් ඔහුට අමතක ය. ගමෙන් පිටවී රජරට ගත කළ සත්මස තුළ තබා, තම ජීවිත කාලය වූ ගත වූ විසි තුන් වස තුළ මෙතරම් සතුටක් විඳි දිනක් ඔහුට මතක නැත. ගොවිකම් විද්‍යාලේ දෙවසක පුහුණුව අවසන් කර උසස් ලෙස සාමාර්ථය ලබා පිට වූ දිනය ඔහුට ප්‍රීතිමත් දිනයකි. දෙවසක් තිස්සේ දහදුක් විඳ ප්‍රතිඵල නිකුත් වනතුරු හේ බලා සිටියේ කොතරම් දෙගිඩියාවකින් ද? පළමු පෙළ සාමාර්ථයක් පමණක් නොව දක්ෂම ශිෂ්‍ය

යාට පිරිනැමෙන රන් පදක්කමද තමාට හිමිවී ඇති බව විදුහල් පතිවරයාගෙන් දැන ගත් විට ඔහු තුළ අපමණ සංතුෂ්ටියක් ඇති විය. එහෙත් අද ඔහු තුළ ඇති ප්‍රීතිය හා සසඳන විට එදා විඳි සතුට අල්ප මාත්‍ර ය.

උස බාප්පා නිසා නොවන්නට තමා අද කොහි සිටිදැයි ඔහුවත් නොදනී. උස බාප් පාට ඔහු සදහටම ණය ගැති ය. පියසේනට මෙම තත්ත්වයට එළඹිය හැකිවූයේ උස බාප්පා නිසාය.

උස බාප්පා සිහිවීමෙන් ඔහුට අතීතය සිහි විය. සත් මසකට පමණ පෙර ඒ තීරණාත් මක දිනය ඔහුට අද මෙන් මතකය. එදින අම්මාගේ වදන එහි මූලටම සිටී.

"ඔය උදැල්ල පැත්තකට දමල ළමය පොතක් පතක් බලා ගනින්. ඔහොම බිම් කොටල පුළුවනෑ හෙට විභාගෙට උත්තර දෙන්ඩ.............." අම්මා කීවේ කලකිරුනු ස්වභාවයකිනි. අම්මා එසේ කීවේ රැකියාවක් නොමැතිව ගෙදරට වී සිටින තමා ඔවුන්ට බරක් වී සිටින නිසාද ? හේ අම්මාගේ බසට අවනත නොවීය.

"උදැල්ල පැත්තකට දමන්ඩ......"? හේ යටි සිතින් තමාගෙන්ම ප්‍රශ්න කෙළේය. "නෑ නෑ .........ශක්‍රයා කීවත් ඉතින් නම් උදැල්ල පැත්තකට දමන්නෙ නෑ......" හේ අවසාන වශයෙන් තීරණය කෙළේ ය.

හේ එදින සවස් වන තුරුම බිම් කෙටු වේය. දවල් බත පිලුනු වන තුරුම, දැන පීදෙන තුරුම, අත්ලෙහි කර ගැට එන තුරුම බිම් කෙටුවේ ය. මහපොළොව කෙරෙහි බැඳුන බඩ වෛරයකින් මෙන් උදැල්ල උස්ස උස්සා කෙටුවේ ය. කැඩුන උදැල්ල එහිම දමූ හේ ළිඳ ළඟට ගොස් ඇඳ සිටි සරම පිටින්ම නා ගත්තේ ය. වේලාව සවස තුන ද පසුවී ඇත. ඔහු කෑම කන්නේ දැන් ය. කෑම පිඟාන හොඳට සීතල ය. ඔහුට හොඳටම බඩගිනි ය. එහෙත් කෑම කෑවේ රුචියකින් නොවේ. කෑම කා අවසන් කළ පසු කුස්සියටම ගොස් කලයෙන් වතුර නමාගෙන බීවේ ය. කාමරයට පැමිණ ඇඳමත වාඩිවී කල්පනා කෙළේ ය.

සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන්නේ පසු දින උදෑසන දහයට ය. උදෑසනින් ම ගෙදරින් පිටත් වූවහොත් නවයට පමණ කොළඹට සම්ප්‍රාප්ත විය හැක. පිටත්වීම සඳහා නැකත් මාමා ලියා දුන් වේලාව යෙදෙන්නේ අළුයම පහයි එකට ය. තාත්තා ද ඔහු සමඟ එනුඇත. එළිවනතුරු නො සිට සවසම පිටත් වීමට ඔහු තීරණය කෙළේය. හේ වහ වහා ඇඳ ගත් තේය. අම්මා ළිඳ ළඟ ය. නංගී ඇගේ කාමර යට වී මොකක්දෝ ගෙත්තම් තරයි. සම්මුඛ පරීක්‍ෂණය සඳහා කොළඹ යන බව හේ නංගීට කීවේය. එදින රෑය සිරි අයියාගේ බෝඩිමෙහි නවතින බව ද කීවේ ය. අම්මා පැමිණෙන්නට ප්‍රථම ගෙදරින් නික්ම ගත යුතු ය. නැතිනම් මේ ගමනට ඇ හරස් කපන්නීය. ඔහු ඊට නොකමැතිය. ගමන බාධා උවහොත් ඔහුගේ සිත නරක් වෙයි. නංගී එසේ නැත. ඕ ඔහු ගැන දනී. එබැවින් හාරා ප්‍රශ්න කිරීමට ඕ බියගුලු ස්වභාවයක් පෙන්වන්නීය. හේ ඒ බව දනී. ඔහු ඇඳ ඇත්තේ ද පුරුදු කලිසම නොවේ. ජාතික ඇඳුම ය. කලිසමක් ඇඳගෙන යන ලෙස අම්මා බලකර කියා සිටිනු ඇත.

හේ ඉක්මන් ගමනින් ගෙදරින් නික්මු නේය. කොළඹ යාම සඳහා කෑගල්ලෙන් කොළඹ බසයකට මාරුවිය යුතුය. නැතිනම් පොල්ගහවෙලට ගොස් දුම්රියෙන් යා යුතුය. දුම්රිය කිනම් වේලාවකට නික්මෙන්නේ දැයි හේ නො දනී. බසයකින් යෑම පහසු බව දැන දැනත් හේ දුම්රිය පොලට ගියේ ය. ඔහු පොල්ගහවෙලට යන විට මහනුවර සිට පැමි ණෙන දුම්රිය පිටත් වූවා විතර ය. ඊළඟ දුම් රිය සඳහා දිගු වේලාවක් ඇත. දුම්රිය පොළේ වූ පාලු බංකුවක වාඩිවූ හේ දෑස් පියා ගත්තේ ය.

පියසේන මඩකලපුව බලා යන රාත්‍රී දුම් රියට ගොඩවූයේ අමුතුම මිනිසෙකු ලෙස ය. මඩකලපුව දක්වාම ටිකට් එකක් මිළදී ගෙන ඇතත් ගමන කෙළවර දක්වා යන බලාපො රොත්තුවක් ඔහු තුළ නැත. ඔහුගේ අදහස හිතට ගැළපෙන කොතනින් හෝ බැස යාම ය. රැකියා ලැබීමේ අදහස ඔහු සිතින් ඉවත් කර ඇත. ඔහුගේ බලාපොරොත්තුව අඳුනන කිසිවෙකු හමු නොවන දුර බැහැර කට ගොස් ගොවිතැන් කොට ජීවත්වීම ය. ඒ සඳහා හොඳම පෙදෙස මඩකලපුව ය. එහි ඔහු දන්නා හඳුනන කිසිවෙකු නැත. මඩකල පුව දුම්රියට ගොඩ වූයේ එහෙයිනි. දුම්රියට

ගොඩ වූ හේ සුදුසු අසුනක් සොයමින් මැදිරි දෙක තුනකට ගියේ ය. එක් මගියෙකු පමණක් සිටින කාමරයකට වී එහි කොනෙහිම වූ අසුන මත වාඩිවී කවුළුවෙන් ඉවත බැලී ය. කවුළුවෙන් පිට අඳුරු ය. කනා මැදිරියෙන් මෙන් තැනින් තැන දිස්වන ගෙවල්වල පහන් විනා පිටත කිසිවක් නො පෙනේ. හේ දෙනෙත් අඳුරෙන් ඉවතට හැරවූයේ ය.

මැදිරියෙහි වූ අනිත් මගියා නිදිබර ගතියකින් පසු වේ. එය පුරුදු මුහුණකි. හේ කල්පනා කෙළේ ය. මඩකලපු දුම්රියෙහි අඳුනන කිසිවෙකු හමුවනු ඇතැයි හේ නො සිතුවේ ය. මගියා ඇස් හැරියේ ය. දෑස පිසදමා අවට බැලී ය. දෙදෙනම එකිනෙකා හඳුනා ගත්හ. පියසේනට උස බාප්පා හමුවූයේ මෙලෙසිනි.

උස බාප්පා පියසේනගෙන් සියළු විස්තර ඇසුවේ ය. තමා දෙසම බලා සිටි උස බාප්පාගේ මනැසට සියල්ල පෙනෙනු ඇත. ඔහුගෙන් කිසිවක් සැඟවිය නො හැක. පියසේන සිදු වූ සියල්ල උස බාප්පාට හෙළි කෙළේ ය. දුර බැහැරකට වී ගොවිතැන් කර ජීවත් වීමේ අදහස ද හෙළි කිරීමට ඔහුට සිදු විය.

මව්පස ඥාතියෙකු වූ උස බාප්පා කලකට ඉහත රජයේ ඉඩම් ලැබ, ගමින් පිට වූවෙකි. පියසේන සිය නිවසට කැඳවාගෙන ගිය උස බාප්පා ඔහුට තමාගේ ඉඩම් වලින් බිම් කොටසක් පවරාදී ගොවිතැනට සියළු පහසුකම් සලසා දුන්නේ ය. ඔහු වගා කළ කුඹුරු බිම් අක්කරයකි. ගොවිකම් විදුහලේදී ලබාගත් දැනුම ද යොදා හේ එම අක්කරය වගා කෙළේ ය. පළමු කන්නයේදීම හේ එයින් බුසල් දෙසීයයකට ආසන්න අස්වැන්නක් ලබාගත්තේ ය. එය උස බාප්පාට දුන් නමුත් ඔහු එය ප්‍රතික්ෂේප කෙළේ ය. විකුණා මුදල් ලබා ගන්නා ලෙස පියසේන පොළඹවන ලද්දේ උස බාප්පා විසිනි. ආණ්ඩුවේ ගබඩාවට වී භාරදී ලබාගත් මුදල ඔහුගේ යට සාක්කුවේ ඇත. රුපියල් දෙදහස් හාර සියයක මුදලක් ඔහු සතුව ඇත. ඔහුට මුදලින් උවමනාවක් නැත. ඔහු ප්‍රිය කළ එළිමහන් ජීවිතය පියසේනට ලැබී ඇත. කුඹුරු වැඩ කිරීමෙන් ඔහුට අවශ්‍ය ව්‍යායාමය ලැබේ. මහන්සිවී වැඩ කළ කුඹුරෙහි ගොයම් පැසී කරලින් බරවන විට කොතරම් සතුටක්ද? ගොවිතැන් තරඟය සඳහා ඉදිරිපත් වූවා නම් පළමුවැනි ත්‍යාගයම ලබා ගැනීමට හැකි උසස් අස්වැන්නක් ඔහුට ලැබී තිබිණ. වී විකුණා ගැනීමෙන් ලැබූ මුදල උස බාප්පා නිසා ලැබූවකි. එය ඔහුටම දිය යුතුයයි පියසේන තීරණය කෙළේ ය.

ඔහු කඩුල්ල ළඟටම පැමිණ ඇතත්, මෙතරම් දුරක් පැමිණි බවක් නොදනී. සිතිවිල්ල එතරම්ම ගැඹුරුය. ගොවිතැනින් මුදල් ඉපයිය හැකිනම් වෙනත් රැකියාවක් කුමටදැයි හේ සිතීය. කන්තෝරුවක පුටු රත්කරමින් සුළු මුදලක් උපයනවාට වඩා, එළිමහනෙහි වැඩ කොට කය වෙහෙසා මුදල් ඉපයීමෙන් කොතරම් සතුටක් අත්කර ගත හැකිද? රජයේ රැකියාවකට යෑමේ අදහසක් දැන් ඔහු තුළ නැත. රැකියා සොයමින් ගතකළ ඇවුරුද්ද තුළ ගොවිතැන් කළා නම් කොතරම් මුදලක් උපයන්නට තිබුණාදැයි ඔහු තමාගෙන්ම ප්‍රශ්න කෙළේය. හිසෙන් හා මුහුනෙන් රූරා හැලෙන ඩාදිය පිස දමූ හේ, ඉස්තෝප්පුවට ගොඩවී, පුටුවක් මත වාඩි විය. පියසේනගේ අදහස ඊළඟ කන්නයට අක්කර දෙකක්වත් වගා කිරීමටය.

නිමි.